## ක්‍රීඩා සඳහා ගියර් (GEAR FOR SPORTS®)

සියලුම හිරිහැරකාරී කම්කරු පිලිවෙත් සහ ශ්‍රමය සූරාකෑමේ ක්‍රියාදාමයනට, ක්‍රීඩා සඳහා ගියර් (GEAR for Sports®) ආයතනයේ කලමනාකරුවන් වන අපද, සේවකයෝ සහ නියෝජිතයෝ ඉදුරාම විරුද්ධ වෙමු. අප නිශ්පාදන වලට සම්බන්ධිත සියලුම සේවකයින්ගේ සුභසිද්ධිය, එනම් ඔවුනට සුදුසු නිපැයුම් වාතාවරනයක් මෙන්ම නිසි වැටුප් සහ අනෙක් ප්‍රතිලාභ, සැලසීමට අප කැපව සිටින්නෙමු. පහත සඳහන් විනය මාලාව අප තරයේ පිළිපදින අතර අපගේ සියලුම කම්හල් ආශ්‍රිතයෝ සහ සැපයුම්කරුවෝ එම විනය මාලාව අවම ප්‍රමිතියක් ලෙසට පිලිගතයුතුය.

### විනය මාලාව

**ජාතික ස්වාධිපත්‍යයඃ** ඇමෙරිකා එක්සත් ජනපදය සමග නිලවශයෙන් වෙළඳ සබඳතා පවත්වාගෙන යන සෑම රාජ්‍යයකම ස්වාධිපත්‍යය අප විසින් පිළිගනු අතර මෙම ස්වාධීන රටවල නීති රීති අප විසින් පිළිපදිනු ඇත.

**නිර්ස්වේච්ඡා ශ්‍රමයඃ** බන්ධනාගාරගත, බැඳුම්කරයකින්, ගිවිසුමකින් හෝ වෙනත් ආකාරයක බැඳීමකින්, බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් සේවය කිසිදු විටෙක ලබා නොගැනීමට අප බැඳෙන අතර එවන් පිලිවෙත්වල ඇති අමානුෂික භාවය පිලිගන්නෙමු.

**ළමා ශ්‍රමයඃ** සියලුම කුඩා දරුවනට තම ලමාවිය රැකියාවක වගකීමෙන් තොරව නිසි අධ්‍යාපනයක් ලැබීමේ අයිතිය අප විසින් පිලිගනු ලබන අතර වයස අවුරුදු 15ට වඩා අඩු හෝ (එවැනි රැකියානියුක්ති සඳහා පාලන නීතිය මගින් වයස අවුරුදු 14ට ඉඩ සලසන) අනිවාර්ය අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට බාධාවන අයුරින් කිසිකෙනෙකු සේවයට බඳවා නොගැනීමට අප බැඳීසිටින්නෙමු.

**විශමතාවයන්ගෙන් තොරව සැලකීමඃ** සියලු මිනිසුන්ගේ සමානාත්මතාව අපි පිලිගන්නා අතර කිසිම සේවකයෙකු ලිංග භේදය, වර්ගය, වංශය, ආගම, අංගවිකල භාවය හෝ දේශපාලන අදහස් මත වෙනස්කම් වලට භාජනය නොකරන්නෙමු.

**හිරිහැරකිරීම්ඃ** සියලු මිනිසුන්ට උරුම ගරුබුහුමන් අප පිලිගනු අතර සියලු සේවකයනට සාදාරනව සහ විනීතව සැලකීමට බැඳීසිටිමු. කිසිම සේවකයෙකු කායික, ශාරීරික, වාචික මෙන්ම, ලිංගික සහ මානසික හිරිහැරයනට බඳුන් කිරීමට නොහැක.

**වැටුප් සහ දීමනාඃ** සේවකයින්ට වැටුප් ගෙවීමේ වගකීම අප පිලිගන්නා අතර නීතියට හෝ සම්ප්‍රදායට අනුකූලව, ඉන් වැඩි දීමනාව ගෙවනු ලැබේ. සේවකයින්ට සාදාරන වැටුප් ගෙවීම අප පිලිපදින අතර ඔවුන්ගේ වැටුප්, ලෝක වෙලඳ පොලෙහි ප්‍රමුඛත්වය

රැකගෙන, ක්‍රමක්‍රමයෙන් වැඩිකිරීමට අපගේ කම්හල් හිමියනට අප අභියෝග කරන්නෙමු.

**කාර්ය වේලාවः** මිනිසුන් රැකියාව කරන්නේ ජීවත් වීමට විනා ජීවත් වන්නේ රැකියාව කිරීමට නොවන බව අප පිලිගනු බැවින්, සේවකයින්ට ප්‍රමානවත් විවේක කාලයක් ලබාදෙනු ඇත. විශේෂ අවස්ථාවක හැර, සතියකට පැය 48ක නිත්‍ය කාල සහ පැය 12ක අතිකාල සේවයකට, සේවාකාලය නීත්‍යානුකූලව සීමාකොට ඇත. අවම වශයෙන් සතියකට එක් දිනක නිවාඩුවකට සේවකයන් හිමිකම් කියනු ලැබේ. අතිකාල සේවා සඳහා දීමනා කිසිදු විටෙක වේතනයට අඩු නොවිය යුතු අතර එම දීමනා නීති මගින් හෝ සම්ප්‍රධානයට අනුකූල, එම දෙකින් වැඩි අනුපාතය ගෙවිය යුතුය.

**ඇසුරු කිරීමේ නිදහසः** සේවකයින්ට එකිනෙකා ඇසුරු කිරීමේ නීත්‍යානුකූල නිදහස අප පිලිගන්නා අතර සංවිධාන කටයුතුවල යෙදෙන සේවකයින්ට විරුද්ධව පියවර ගැනීම අප විසින් තහනම් කර ඇත.

**සෞඛ්‍ය සහ සුරක්‍ෂාවः** අනතුරුවලින් ආරක්‍ෂා විය හැකි සුරක්‍ෂිත සේවා පරිසරයක් සැපයීමට අප බැඳී සිටින අතර එම තත්වය නේවාසික පහසුකම් ඇති අවස්ථාවන්හිදී පවා අදාළ වේ.

**ස්වාධීන නිරීක්‍ෂනයः** අදාල පාර්ශයන් අතර නිදහස් අදහස් හුවමාරුවෙහි ඇති වැදගත්කම අප අගයකර ඒ සඳහා දිරි දෙන අතර ඒ සඳහා ස්වාධීන නිරීක්‍ෂන මන්ඩල පත් කරන මෙන්, කම්හල් හිමියන්ගෙන් සහ කලමනාකරුවන්ගෙන් අප ඉල්ලා සිටිමු.

**පරිසරයः** භූමියේ සහ දියපහරවල වැදගත්කම පූජනීයත්වයෙන් සලකන බැවින් පරිසරය සුරැකීමට අප බැඳී සිටින්නෙමු. ඒ සඳහා ඇති ජාතික සහ ග්‍රාමීය නීතිවලට අප යටත් වෙන්නෙමු.

**රේගුවට ඇති අනුකූලතාවයः** එක්සත් ජනපද රේගුවෙහි ප්‍රමිතීන්ට අනුව අවංක සහ නිවැරදි දත්තයන් සැපයීම අප සැමවිටම අපේක්‍ෂා කරන්නෙමු. ඔවුන්ගේ සියලුම අදාල නීතීන්ට, විශේෂයෙන්ම, නීතිවිරෝධී නාවික ප්‍රවාහනය, හිමි පංගුව පිලිබඳ වංචා සහ වානිජමය ලේබන වෙනස් කිරීමට විරුද්ධව ඇති සියලුම නීති රැකීමට පූර්න ලෙස බැඳී ඇත.

මෙය අපේ අවම නීති මාලාව වන අතර අපගේ සියලු කම්හල් ආශ්‍රිතයන් සහ සැපයුම් කරුවන් මෙම නීති පිලිපැදිය යුතුය. මෙම නීති බිඳින ඕනෑම කෙනෙකු සමග සම්බන්ධතාවය බිඳීමේ අයිතිය ක්‍රීඩා සඳහා ගියර් (GEAR for Sports®) ආයතනය සතුව ඇත.